රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2014

මගේ අංකය :- EST-3/CERTI/06/9436
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2014.04.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## බඳවා ගැනීමේ පරිපාටිවලට ඇතුළත් කළ යුතු වෙනත් අධ්‍යාපනික සුදුසුකම්

බඳවා ගැනීමේ පරිපාටීන්හි ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් සහ ඒ සඳහා අදාළ කරගත හැකි විකල්ප අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1977.03.09 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 234, 1987.09.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 379, 1990.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90, 1994.06.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (I), 1995.10.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (II), 2010.01.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (III), 2011.10.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (IV) හා 2012.05.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (V) හි විධිවිධාන සම්බන්ධයෙන් වන පහත කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කෙරේ.

02.(අ) ඉහත සඳහන් චක්‍රලේඛ මගින් සුදුසුකම් හඳුන්වා දී ඇත්තේ පත්කිරීම් බලධරයන්ගේ අවශ්‍යතාව පරිදි තනතුරුවලට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් බඳවා ගැනීමේ පරිපාටි සඳහා ඇතුළත් කර එම තනතුරු සඳහා සුදුසු පුද්ගලයින් බඳවා ගැනීම පහසු කිරීමේ පරමාර්ථයෙනි.

(ආ) එම චක්‍රලේඛ මගින් අධ්‍යාපන සුදුසුකම් සමාන කර තිබුන ද එම අධ්‍යාපන සුදුසුකම්වල එකිනෙකට අනන්‍ය වූ ලක්ෂණයන් පවතින බැවින් සමාන කළ අධ්‍යාපන සුදුසුකම් සර්වසම ලෙස සලකා කටයුතු කිරීමට සිදුවීමෙන් පත්කිරීම් බලධරයන් ගැටළුවලට මුහුණ පා ඇති බව නිරීක්ෂණය වී ඇත.

(ඇ) එක් එක් කාල වකවානු තුළ අධ්‍යාපන ආයතනයන්හි සිදුකරන පරිපාලන වෙනස්කම් තුළින් සහ විෂය නිර්දේශ වෙනස් කිරීම් තුළින් සහතිකවල ද වෙනස්කම් සිදු වේ. එවිට දැනට චක්‍රලේඛ මගින් විකල්ප සුදුසුකම් ලෙස හඳුන්වා දී ඇති අධ්‍යාපන සුදුසුකම් ඒ ආකාරයෙන්ම විකල්ප සුදුසුකම් ලෙස පිළිගැනීම ගැටළු සහගත වේ.

(ඇ) එබැවින් තනතුරක් සඳහා බඳවා ගැනීමේ දී එම තනතුරට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව අදාළ අනෙකුත් බලධරයන්ගේ ද එකඟතාව මත තීරණයක් ගැනීමේ අයිතිය පත්කිරීම් බලධරයා සතු විය යුතුය. එහි දී තනතුරට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හෝ විකල්ප අධ්‍යාපන සුදුසුකම් ඇතුළත් කිරීමට ඇති ඉඩකඩ ඉහත චක්‍රලේඛ විධිවිධාන හේතුවෙන් අවහිර වී තිබේ.

03. ඉහත 02 ඡේදයෙහි සඳහන් කරුණු සැලකිල්ලට ගෙන බඳවා ගැනීමේ පරිපාටීන්හි ඇතුළත් කළ යුතු වෙනත් අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් නිකුත් කළ 1977.03.09 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 234, 1987.09.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 379, 1990.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90, 1994.06.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (I), 1995.10.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (II), 2010.01.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90(III), 2011.10.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (IV) සහ 2012.05.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 (V) යන චක්‍රලේඛ, එම චක්‍රලේඛයන්ට අදාළව මෙතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි අවලංගු කිරීමට 2013.12.16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

04. මින් ඉදිරියට ඉහත අවලංගු කරන ලද චක්‍රලේඛවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් යම් තනතුරකට අදාළ සේවා ව්‍යවස්ථාවකට හෝ බඳවා ගැනීමේ පරිපාටියකට ඇතුළත් කිරීමට අවශ්‍ය වන්නේ නම් පත්කිරීම් බලධරයා හෝ පරිපාලන බලධරයා විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිර්දේශ ලබාගෙන අදාළ බලධරයන් විමසමින් ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගත හැකි ය.

නිදසුන් :- දැනටමත් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7:2:2:1 අධ්‍යාපන සුදුසුකම් යටතේ සඳහන් (II) උපඡේදය :

> "ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියෙකු විය යුතු ය."

05. ඉහත පරිදි තනතුරු සඳහා යෝග්‍ය වන්නා වූ අධ්‍යාපන සුදුසුකම් සේවා ව්‍යවස්ථාවලට හෝ බඳවා ගැනීමේ පරිපාටිවලට ඇතුළත් කිරීමට පත්කිරීම් බලධරයන්/පරිපාලන බලධරයන් පියවර ගත යුතු ය.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය